සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

9350

Learning Resource Center
Kandana

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
**Year End Evaluation**

2016.11.17

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ................................................ විභාග අංකය :- ..............................

## I කොටස

සැලකිය යුතුයි:

- එක් එක් ප්‍රශ්නයට අදාළ වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- පිළිතුරු සපයා අවසානයේ II පත්‍රයේ පිළිතුරු සමග එකට අමුණා භාර දෙන්න.

---

(01) ජාකොබ් තුමාගේ මව වන්නේ,
(1) සාරා ය (2) රෙබෙකා ය (3) රාකෙල් ය (4) ලෙයා ය

(02) ස්නාවක ජුවාම් තුමා "පොලොන් වංශය" ලෙස අමතන්නේ,
(1) පරිසිවරුන්ට හා හේවායින්ට ය (2) හේවායින්ට හා සද්දුසිවරුන්ට ය
(3) සාමාන්‍ය ජනතාවට හා අයකැමියන්ට ය (4) පරිසිවරුන්ට හා සද්දුසිවරුන්ට ය

(03) "එබැවින් ඔබ ගොස් සකල ජාතීන් ................................ කරන්න" මෙහි හිස්තැනට සුදුසු වචනය වන්නේ,
(1) සුවපත් (2) බෞතිස්ම (3) ගෝලයන් (4) ස්තාපනය

(04) අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා ශුද්ධ වූ සභාවේ ................................ වැනි ශුද්ධෝත්තම පියතුමා වේ. මෙහි හිස්තැනට සුදුසු සංඛ්‍යාව වන්නේ,
61) 262 (2) 263 (3) 265 (4) 266

(05) දේශීය කිතුනු සාහිත්‍යයේ පුරෝගාමියා වූයේ
(1) ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමාය
(2) ගෞරවනීය ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා
(3) ගෞරවනීය මර්සලීන් ජයකොඩි පියතුමා
(4) ගෞරවනීය මයිකල් රොද්‍රිගු පියතුමාය

(06) ජන වන්දනා වසර ආරම්භ වන්නේ,
(1) පාස්කු සමයෙනි (2) ආගමන සමයෙනි
(3) නත්තල් සමයනි (4) චතාරික සමයෙනි

(07) ජේසුස් වහන්සේ උතුරු සළුව ගලවා තබා ශ්‍රාවකයන්ගේ පාද සේදූ බව සඳහන්වන සුවිශේෂය වන්නේ,
(1) ශු. ජොහන් ය (2) ශු. ලූක් ය (3) ශු. මතෙව් ය (4) ශු. මාක් ය

(08) යුක්තියට සා පිපාස ඇත්තෝ භාග්‍යවන්තයෝ ය. ඔවුහු ................................ මෙම හිස්තැන පිරවීමට සුදුසු වන්නේ,
(1) දෙවියන් දකින්නෝය (2) තෘප්තිමත් වන්නෝය
(3) දයාව ලබන්නෝය (4) සැනසීම ලබන්නෝය

(09) මීසම් පවුලේ වාර්ෂික මංගල්‍යය පිළිබඳව අදහස් කීපයක් ශිෂ්‍යයෙක් ප්‍රකාශ කර තිබුණේ මෙසේය

A මීසමක් වශයෙන් සැමරිය යුතු උතුම්ම දෙය මංගල්‍යයයි

B සන්ධ්‍යා මෙහෙය දේව ජනතාව එක්කරණු ලබන අවස්ථාවකි

C මංගල්‍යයට ඉතා අලංකාරව පැමිණීමෙන් දෙවිඳුන් සතුටු කළ හැක

D මංගල්‍යයට සහභාගි වී පවුලක් ලෙස සතුට බෙදාගමු.

ඔහු ප්‍රකාශ කළ ඒවා අතරින් කිතුනු වටිනාමක් සහිත ප්‍රකාශ වන්නේ,

(1) A හා B ය (2) A හා C ය (3) C හා D ය (4) B හා D ය

(10) "සහෝදරයෙනි, එකිනෙකාට විරුද්ධව.............................. නොදොඩවන්න" ශු. ජාකොබ්තුමාගේ ලිපියට අනුව හිස්තැන පිරවීමට සුදුසු පිළිතුර වන්නේ,

(1) ඕපදූප (2) කේලම් (3) වහසිබස් (4) අපහාස

(11) ජපමාල මෑණියන්ට කැප කළ මංගල්‍යය පවත්වනු ලබන්නේ,

(1) මැයි 31 වනදා ය (2) සැප්තැම්බර් 08 වනදා ය

(3) ඔක්තෝබර් 07 වනදා ය (4) දෙසැම්බර් 08 වනදා ය

(12) පාද නමස්කාරය පිළිබඳව ශිෂ්‍යාවක ලබාදුන් පිළිතුරු කීපයක් පහත දැක්වේ.

A ක්‍රි. ව. 303 දී පමණ පාද නමස්කාරය ආරම්භ විය.

B මෙය කතෝලික ජනයාගේ පාරම්පරික භක්ති අභ්‍යාසයකි.

C දිනපතා ශුද්ධ වූ පැය කරන විට පාද නමස්කාරයට යා යුතුම නැත.

ඉහත පිළිතුරු අතරින් නිවැරදි වන්නේ,

(1) A ය (2) B ය (3) A හා C ය (4) A, B හා C ය

(13) චතාරික සමයේ කල්වාරි ගමන සිහි ගන්වන හොඳම වන්දනා ගමන මින් කුමක් ද?

(1) මඩු සිද්ධස්ථානය වෙත යාමය

(2) තේවත්ත බැසිලිකාව වෙත යාමය

(3) මාතර සිද්ධස්ථානය වෙත යාමය

(4) හිනිදුම පුදබිම වෙත යාමය

(14) "ආලෝකයේ අභිරහස්" ශුද්ධාසන ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ ශුද්ධෝත්තම පියතුමා වන්නේ,

(1) අති උතුම් දෙවන ජුවාම් පාවුලු පාප්තුමා ය.

(2) අති උතුම් ෆැන්සිස් පාප්තුමා ය

(3) අති උතුම් දාසයවන බෙනඩික් පාප්තුමා ය.

(4) අති උතුම් පස්වන පියුස් පාප්තුමා ය.

(15) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ වැඩ සිටීම.............................. සලකුණෙන් අපට පෙනේ. ක. ස. ධ 1378ට අනුව නිවැරදි පිළිතුර තෝරන්න.

(1) කුරුසිය (2) පූජා හා මිදි රස (3) බැටළුවාගේ (4) පරවියාගේ

(16) ආබ්‍රහම් තුමා පිළිබඳව කථාවක් කිරීමට කී විට ශිෂ්‍යයෙක් කියූ ප්‍රකාශවලින් කීපයක් පහත දක්වේ.

A දෙවියන් වහන්සේ ගැලවීමේ සැලැස්ම ඉටු කිරීමට තෝරාගත් පළමුවැන්නා ආබ්‍රහම්තුමාය

B ආබ්‍රහම්තුමාට දෙවියන් වහන්සේ දුන් පොරොන්දුවේ කරුණු 3ක් විය.

C වයස අවුරුදු 75ක් පිරුණු විට ඔහුට ඊසාක්ව ලැබුණි.

D ආබ්‍රහම්ගේ මෙහෙකරුවෝ පූජාසනය ළඟ ළිඳක් කැණුහ.

මේවායින් නිවැරදි පිළිතුර සහිත අංකය තෝරන්න.

(1) A හා C වේ (2) A හා B වේ (3) B හා C වේ (4) C හා D වේ

(17) චාරික කාලයට පමණක් අදාල භක්ති අභ්‍යාස අඩංගු පිළිතුර වන්නේ,

(1) අළු තැවරීම, කුරුස පැය දහන, ශුද්ධ වූ පැය, පසන් ලතෝනි ගායනා
(2) අළු තැවරීම, පසන් ලතෝනි ගායනය, ජපමාල භක්තිය, ශුද්ධ වූ පැය
(3) අළු තැවරීම, කුරුස්පැය දහන, පසන් ලතෝනි ගායනා, පාස්කු නාට්‍ය
(4) අළු තැවරීම, ශුද්ධ වූ පැය, ජපමාල භක්තිය, පාස්කු නාට්‍ය

(18) ජේසුස් වහන්සේගේ සාමාන්‍ය ජීවිතය හා ධර්මදූත සේවාව පිළිබඳ මෙනෙහි කරන අභිරහස වන්නේ,

(1) සොම්නස් අභිරහස ය
(2) ආලෝකයේ අභිරහස ය
(3) දොම්නස් අභිරහස ය
(4) මහිම අභිරහස ය

(19) යහපත් සමාරියයාගේ උපමාව තුළින් මතුවන චරිත ගණන,

(1) දෙකකි (2) තුනකි (3) හතරකි (4) පහකි

(20) ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමා ලංකාවට පැමිණි වර්ෂය වන්නේ,

(1) ක්‍රි. ව. 1651 ය (2) ක්‍රි. ව. 1658 ය (3) ක්‍රි. ව. 1687 ය (4) ක්‍රි. ව. 1705 ය

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් ද අනෙක් එක් එක් ප්‍රශ්නයට ලකුණු 11 බැගින් ද හිමිවේ.**

(01) දෛනික යාච්ඤාව ජීවිත පුරුද්දක් කර ගැනීම සඳහා ගුරු භවතාගේ මඟ පෙන්වීම යටතේ සකස් කළ පොත් පිංච ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(1) පොත් පිංච නිර්මාණය කිරීමට භාවිත කළ මූලාශ්‍ර 2ක් සඳහන් කරන්න. (ලකුණු 04)
(2) දෛනිකව භාවිතා කළ හැකි එක් නිල යාච්ඤාවක් ලියන්න. (ලකුණු 04)
(3) පොත් පිංච නිර්මාණය කිරීම නිසා ඔබට ලැබුණු ප්‍රයෝජන 4ක් ලියන්න. (ලකුණු 04)
(4) ඔබ රාත්‍රී නින්දට යාමට පෙර දෙවිපියාට ස්තුති කරමින් කිවහැකි යාච්ඤාවක් නිර්මාණය කරන්න. (ලකුණු 04)

(02) (1) ජේසුස් වහන්සේ ධර්මදූත චාරිකාව සඳහා යැවූ පුද්ගලයන්ට දුන් අවවාද 2ක් ලියන්න. (ලකුණු 02)
(2) වපුරන්නාගේ උපමාවේ සඳහන් බීජ වැටුණු ස්ථාන 3ක් නම් කරන්න. (ලකුණු 03)
(3) ශුද්ධාත්මයාණන්ගේ පූර්ණ වූ දරුවෙකු ලෙස ඔබට පැමිණෙන අහිතකර බලවේග 6ක් ලියා ඒවා ජය ගන්නා ආකාරය ද ලියන්න. (ලකුණු 06)

(03) (1) ස්නාවක ජුවාම්තුමාගේ දේශනා අඩංගු සුවිශේෂ 2 නම් කරන්න. (ලකුණු 02)
(2) එතුමාගේ නිහතමානීකම දක්වෙන ප්‍රකාශ ලියා එතුමා අවවාද කළ පුද්ගල කණ්ඩායම් 3ක් නම් කරන්න. (ලකුණු 03)
(3) ස්නාවක ජුවාම්තුමා අද සිටියා නම් ළමා ඔබට දෙන අවවාද 6ක් ලියන්න. (ලකුණු 06)

(04) (1) ඊසාක් තුමා හා ජාකොබ් තුමා දේව ක්‍රියාකාරිත්වය අත්දුටු ස්ථාන 2 නම් කරන්න. (ලකුණු 02)

(2) ආබ්‍රහම්තුමා දේව කැඳවීම තුළ අත්හල දේවල් 2ක් හා රැගෙන ගිය දේවල් 3ක් ලියන්න. (ලකුණු 03)

(3) "දේව කැමැත්ත මිහිමත දේව රාජ්‍යය ගොඩ නැගීමයි" මේ සඳහා ඔබට කළ හැකි දේවල් 6ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(05) (1) 8 ශ්‍රේණියේ කතෝලික ධර්මය පෙළපොතේ සඳහන් වන දෙමාපියන්ට හා දරුවන්ට උපදෙස් දෙන පොත් 2ක් නම් කරන්න. (ලකුණු 02)

(2) දෙමාපියන් වෙනුවෙන් ළමා ඔබේ යුතුකම් 2ක් හා දෙමාපියන් ඔබ වෙනුවෙන් කළ යුතු දේවල් 3ක් ලියන්න. (ලකුණු 03)

(3) ඔබ වෙනුවෙන් වෙහෙසෙන දෙමාපියන් වෙනුවෙන් දෙවිපියාණන් වහන්සේට යැදුමක් ලියන්න. (පේළි 6කින් පමණ) (ලකුණු 06)

(06) (1) නිල ජන වන්දනාවේ කොටස් 2ක් නම් කරන්න. (ලකුණු 02)

(2) ජන වන්දනාවේ ප්‍රධාන අරමුණු 3 ලියන්න. (ලකුණු 03)

(3) අධ්‍යාත්මික සුවයක් ලැබීමේ අරමුණින් වන්දනා ගමනක් යාමේ දී අප කළ යුතු කාර්යයන් 6ක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(07) (1) ජුදාවරුන්ගේ අවමඟුල් සිරිතට අනුව ජේසුස් වහන්සේගේ මෘත ශරීරයට කළ දේවල් 2ක් ලියන්න. (ලකුණු 02)

(2) මීසමේ පියතුමා ඉටුකරන සේවාවන් 3ක් ලියන්න. (ලකුණු 03)

(3) ඔබ මීසමේ ක්‍රියාත්මක වන දයාවේ සමිති 3ක් නම් කර ඉන් ඉටුකරන සේවාවක් බැගින් ලියන්න. (ලකුණු 06)